# බළන්ගොඩ නගර සභාව

## 2020-04-06 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.04.06**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

2020-04-06 වන දින මාසික මහ සභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය පිළිගැනීමෙන් අනතුරුව 2020-03-10 වන දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් 2020-03-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධන කිසිවක් නොතිබුණි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අසනීප තත්ත්වයේ පසුවන බැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර එතුමාගේ නිවාඩු අනුමත කරන බව පවසන ලදී.
- රටේ පවතින වසංගත තත්ත්වය හමුවේ බළන්ගොඩ නගරයේ අවශ්‍ය කාර්යයන් කරගෙන යාම සඳහා සභාවේ සියලු දෙනා තමා වෙත ලබා දෙන සහයෝගය සඳහා ස්තුතිය පළ කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ නගර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින්, නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් සංවර්ධන හා කළමනාකරණ අධ්‍යක්ෂකගේ 10/2/881 හා 2020.03.04 වන දිනැති ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, මෙම ඉඩම මැනීම පිළිබඳ කිසිඳු විරෝධතාවයක් නොමැති නමුත් මෙම ඉඩම මැන කුමන ආකාරයෙන් අයිතිය පැනනැඟුණද ක්‍රීඩා පිටියෙන් එකඳු බිම් අඟලක්වත් නොදෙන අතර මෙම ඉඩම සම්පූර්ණයෙන්ම බළන්ගොඩ නගරයේ මිනිසුන් වෙනුවෙන් තිබිය යුතු බවද අදාළ පාර්ශවයට හිමිකමක් තිබුණද ඔවුන්ට වන්දි මුදලක් ගෙවා මෙම ඉඩම බළන්ගොඩ ජනතාව වෙත ලබා දිය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අත්පත් කර නොගත් ඉඩම් කොටසක් තිබෙන නමුත් වට මැනුම් සකස් කර අයිතිය සොයා නොදීම ප්‍රාදේශිය ලේකම්තුමාගේ වැරැද්දක් බවද තමන් සභාපතිව සිටි සමයේදී මෙම පුද්ගයින් සඳහා කාර්පාක් කඩ කාමර පිහිටා ඇති කොටසින් ඉඩම් කොටසක් ලබාදීමට සූදානම් වුවද ඔවුන් එයට අකමැති වූ බවද පවසන ලදී. එමෙන්ම මෙම පුද්ගලයාට මෙම ඉඩම සඳහා රජය විසින් වන්දි මුදලක් ලබා දීම පිළිබඳ විරුද්ධ නොවන බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාළ කණ්ඩායම මැනීම් සිදු කිරීමේදී නගර සභා ක්‍රීඩා පිටියේ ක්‍රීඩාගාරය වන තෙක් මැනීම් සිදු කර ඇති අතර බලන්ගොඩ නගරයට තිබෙන එකම ක්‍රීඩා පිටිය මෙය වන බැවින් මෙය වෙනත් කිසිවෙකුට ලබා දිය නොහැකි බවත් මොවුන්ට අයිතියක් තිබේනම් රජය විසින් මෙය මැන ඔවුන්ට වන්දියක් ලබා දිය යුතු බවත් පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් මෙහි වර්ථමාන තත්ත්වය කුමක්දැයි විමසා සිටි අතර එහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාළ පාර්ශවය විසින් අධිකරණයේ ගොනු කර තිබූ නඩුව ඔවුන්ට අයිතිය සනාථ කර ගැනීමට නොහැකිව ඉල්ලා අස්කර ගත් බවයි. එමෙන්ම මේ වන විට මෙම ඉඩම් කොටස කිසිවෙකුටත් අයිති නොමැති අතර ඉඩම් භුක්තිය බළන්ගොඩ නගර සභාව සතු වන බව පවසන ලදී. මෙම ඉඩම මැනීම පිළිබඳ කිසිඳු විරෝධයක් නොමැති අතර මෙම ඉඩමෙහි අයිතිය කුමන ආකාරයෙන් පැවතියද බළන්ගොඩ ක්‍රීඩා පිටිය බළන්ගොඩ ජනතාවට පැවතිය යුතු බව පවසන ලදී. මෙම ඉඩම් මැනීමේදී ක්‍රීඩා පිටියේ කොටසක් අදාළ පාර්ශවය වෙත ගියහොත් රජය විසින් ඔවුන්ට වන්දි මුදලක් ලබා දිය යුතු බවද මෙම ඉඩම් කොටස බළන්ගොඩ අනාගතය වෙනුවෙන් පැවතිය යතු බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙය නිසි පරිදි නිරවුල් විය යුතු අතර ක්‍රීඩා පිටිය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් සියලු දෙනා එක්විය යුතු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා, තමන් එම පුද්ගලයින් ඉතා හොඳින් ඇසුරු කරන පිරිසක් වන අතර බස්නැවතුම්පල හා මහජන පොළ ඉදිකිරීම සඳහා ඔවුන්ගේ ඉඩම් ලබා ගත් අතර ඔවුන්ට ඉතිරිව ඇති ඉඩම් කොටස මෙය පමණක් වන අතර නාගරික සංවර්ධන සතු ඉඩමක් හෝ වෙනත් ඉඩමක් මොවුන්ට ලබා දෙන ලෙසද පවසන ලදී. එමෙන්ම මෙම ඉඩම් තුලින් නගර සභාව ආදායමක් ලබා ගන්නා බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික් මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා බස්නැවතුම්පල සකස් කිරීම සඳහා ඉඩම ගොඩ කිරීමට රුපියල් කෝටි තුනක මුදලක්

වියදම් වූ අතර එමගින් වගුරු බිමක්ව පැවති මෙම ඉඩමට වෙළෙඳ වටිනාකමක් ලැබී ඇති බව පවසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, අදාළ පාර්ශවය විසින් කිසිඳු ස්ථානයක තම අයිතිය ඔප්පු කර නොමැති බැවින් වෙනත් ඉඩමක් ලබා දීම සඳහා නීත්‍යානුකූල පදනමක් නොමැති බව පවසන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා අදාළ පාර්ශවය සභාවට කැඳවා තීන්දුවක් ගැනීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙය අධිකරණය මඟින් පැවති නඩුවක් හා සබැඳි කාරණයක් වන බැවින් මේ සම්බන්ධ තීන්දුවක් සභාවට ගත නොහැකි බවයි.

අනතුරුව මේ පිළිබඳව ගරු ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ගරු ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, අදාළ පාර්ශවය විසින් මෙම ඉඩම පිළිබඳ තම අයිතිය ඔප්පු කළ යුතු අතර ඒ සඳහා අදාළ මැනීම් සිදු කර ද මෙම ඉඩම සඳහා අයිතිය කුමන ආකාරයෙන් පැනනැගුණද අදාළ පාර්ශවයට හිමිකමක් තිබුණද ඔවුන්ට වන්දි මුදලක් ගෙවා මෙම ඉඩම බළන්ගොඩ ක්‍රීඩා පිටිය සඳහා ලබා දිය යුතු බව පවසන ලදී.

## 04. කල් දී ඇති යෝජනා

### 04:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

04:01:01 නගර සභා කොම්පෝස්ට් පොහොර 1kg ක් රු.5.00කට අලෙවි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

නගර සභා කොම්පෝස්ට් පොහොර 1kg ක් රු.5.00කට අලෙවි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙරට තුළ දැනට පවතින වසංගත තත්ත්වය පහව යන තෙක් මහජනතාව හට පවතින ආර්ථික අපහසුතා පිලිබඳව සළකා බලා සහ රජය විසින් ගෙන යනු ලබන ගෙවතු වගා වැඩසටහන හා සමගාමීව මෙම ක්‍රියාදාමය සිදු කළ අතර නගර සීමාව තුළ පොහොර ප්‍රවාහනය නොමිලේ සිදු කරන අතර නගර සීමාවෙන් පිටත පොහොර ප්‍රවාහනය සඳහා මුදලක් අය කරන බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා නගර සභා කොම්පෝස්ට් පොහොර 1kg ක් රු.5.00කට ලබා දීම සුදුසු අතර හැකියාවක් තිබේනම් ගෙවතු වගාව සිදු කරන පුද්ගලයින් සඳහා පොහොර 25kg ක් නොමිලේ ලබා දෙන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ02 කර්මාන්ත අංශයේ සේවය අහිමි සේවකයින් සඳහා රු.140,000.00 ක උපරිමයකට යටත්ව වියළි සලාක ලබා දීම

කර්මාන්ත අංශයේ සේවය අහිමි සේවකයින් සඳහා රු.140,000.00 ක උපරිමයකට යටත්ව වියළි සලාක ලබා දීමේ ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ03 පවතින වසංගත තත්ත්වය පිළිබඳව නාගරික ජනතාව දැනුවත් කිරීමේ ශබ්ද විකාශනය සඳහා අදාළ මුදල් ගෙවීම.

සවුන්ඩ් සිස්ටම් එක සවිකිරීම සඳහා අදාළ මුදල් ගෙවීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි කොරෝනා ව්‍යාප්තය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා බළන්ගොඩ නගරයේ සවුන්ඩ් සිස්ටම් එකක් සවිකර ඇති අතර ඒ සඳහා නාලක ජේ.හෙට්ටිආරච්චි මහතා සඳහා රු.34,975.00 ක මුදලක් ගෙවිය යුතු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04ඃ01ඃ04 පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ACLG 04 /08 හා 2020-01-28 දිනැතිව යොමු කරන ලද "රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය" යන ලිපිය හා මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 7/2019 ප්‍රකාරව Bolero Truck රථය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ගේ

අනුමැතිය ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇතත් මේවන තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. එම අනුමැතිය ලැබෙන තෙක් එම රථය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:05 රු.10,000.00 ට වැඩි ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|
| පොහොර හැලීම හා කසළ තේරීම 2020-02-01 සිට 2020-02-29 (දෛනික වැටුප්) | 32-6 | 5168 | 170,200.00 |
| දෛනික කම්කරු හා රියදුරු යෙදවීම (කසළ ඉවත් කිරීම) 2020-02-01 සිට 2020-02-29 දක්වා | 32-9 | 5168 | 178,645.58 |
| කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ වැසිකිළි නඩත්තුකරු වැටුප් ගෙවීම 2020-02-01 සිට 2020-02-29 දක්වා | 33-01 | 5188 | 33,358.34 |
| කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ කම්කරු වැටුප් ගෙවීම 2020-02-01 සිට 2020-02-29 දක්වා | 33-2 | 5188 | 354, 958.28 |
| පොහොර හැලීම හා කසළ තේරීම 2020-03-01 සිට 2020-02-31(දෛනික වැටුප්) | 01-01 | 011752 | 155,825.00 |
| පොලිතීන් තේරීම 2020-03-01 සිට 2020-03-31 වැටුප් ගෙවීම | 01-02 | 011752 | 50,600.00 |
| දෛනික කම්කරු හා රියදුරු යෙදවීම (කසළ ඉවත් කිරීම) | 01-03 | 011752 | 169,050.00 |
| කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ වැසිකිළි නඩත්තුකරු වැටුප් ගෙවීම 2020-03-01 සිට 2020-03-31 | 01-04 | 011752 | 36,400.00 |
| කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ කම්කරු වැටුප් ගෙවීම 2020-03-01 සිට 2020-03-31 | 01-05 | 011752 | 240,500.00 |
| දෛනික වැටුප් ගෙවීම - පොදු 2020-03-01 සිට2020-30-31 | 01-06 | 011752 | 133,47.65 |
| සාමාන්‍යාධිකාරි, ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය | 02 | 011756 | 324,914.00 |
| බී.කේ.ජී.පෙට්‍රෝලියම් | 03 | 011757 | 151,225.67 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:06 2020-03-01 දින සිට 2020-03-31 දක්වා ඉන්ධන බිල්පත් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **2,662,096.76** |
| වෙනත් ලැබීම් | **1,954,357.69** |
| මුලු ලැබීම් | **4,616,454.45** |
| පුනරාවර්තන වියදම් | **7,474,667.88** |
| වෙනත් වියදම් | **2,850,035.58** |
| මුලු වියදම් | **10,324,703.46** |

2020-03-01 දින සිට 2020-03-31 දක්වා ඉන්ධන වාර්තාව

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 227-5020 | 6,240.00 |
| RD - 8240 | 27,040.00 |
| 56-1906 | 27,652.00 |
| BC-0005 | 29,120.00 |
| GC 0001 | 1,990.00 |
| ZA -0228 | 6,790.00 |
| LL - 7688 | 4,160.00 |
| HF - 8558 | 7,555.00 |
| GK-1483 | 4,160.00 |
| GK-6227 | 22,486.00 |
| | 795.00 |
| JD-4684 | 3,089.35 |
| LL-2110 | 14,991.00 |
| ND-5124 | 21,840.00 |
| OS0006 | 2,610.00 |
| PF-4006 | 22,849.20 |
| QL-2901 | 5,480.00 |
| RC-1107 | 26,120.00 |
| | 538.00 |
| RC-8183 | 30,160.00 |

| | |
|---|---|
| RE-2600 | 18,720.00 |
| UQ - 1933 | 4,110.00 |
| VI - 1833 | 1,096.00 |
| ZA-9835 | |
| YG-0758 | 2,055.00 |
| OV/M0017 | 1,650.00 |
| ZA - 5039 | 37,199.92 |
| | 12,864.96 |
| | 0.00 |
| **එකතුව** | **330,496.47** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අද දින නගර සභාව විසින් සිදු කළ නිවේදනය ප්‍රකාරව බළන්ගොඩ නගරයේ ඇතැම් වෙළෙඳසැල් වසා දමුණු අතර එම නිවේදනය ප්‍රකාරව තුඹගොඩ කොමියුනිකේෂන් හා පොත්කඩ වසා දමා ඇතත් බළන්ගොඩ නගරයේ කොමියුනිකේෂන් විවෘතව පවතින බැවින් සැමට සාධාරණයක් සිදු කරන ලෙස පවසන ලදී.

එමෙන්ම වාහන නැවතුම් ගාස්තු වශයෙන් අනුමත කර ඇති ගාස්තු වලට වඩා වැඩි මුදලක් අද දින මහජනතාවගෙන් අය කරමින් සිටින බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරු විසින් තුඹගොඩ සිට සියළු වෙළෙඳසැල් පරීක්ෂා කරමින් බළන්ගොඩ නගරය තෙක් පැමිණෙන බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් කොවිඩ් 19 රෝග ව්‍යාප්තියත් සමග ගරු සභාපතිතුමන් විසින් ගෙනයන වැඩපිළිවෙල ඉදිරියට කරගෙනයාම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබාදිය යුතු අතර මෙම වැඩපිළිවෙළ ඉදිරියටත් කරගෙන යන ලෙස පවසන ලදී. මේ සම්බන්ධව ගරු සභාව විසින් ගත් තීරණ මේවන විට 90% ක්ම ක්‍රියාත්මක නොවන බැවින් ඒ පිළිබඳව කණගාටුව පළ කරන ලදී. එමෙන්ම ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන වගකීම වන අතර මේ දින වල දිගින් දිගටම ඇඳිරි නීතිය ක්‍රියාත්මක බැවින් අඩු ආදායම්ලාභි ජනතාව වෙත මේ දින වල ලබා දෙන රු.5,000.00 දීමනාව කිසිඳු දේශපාලන භේදයකින් තොරව සැම දෙනාටම ලබා දිය යුතු අතර අදාළ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා ග්‍රාම නිළධාරි ප්‍රමුඛ අදාළ වසම භාර රාජ්‍ය නිළධාරීන් හා එක්ව මෙය ඉටු කළ යුතු බව පවසන ලදී. බඩගින්නට පක්ෂයක් පාටක් නොමැති බැවින් මෙම දීමනාව සාධාරණව ලබා දිය යුතු අතර පළාත් පාලන නියෝජිතයින් මේ සඳහා මැදිහත් විය යුතු බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් තමන් නියෝජනය කරන තුඹගොඩ වසමේ රු.5,000.00 දීමනාව බෙදාදීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා එම වසමේ ග්‍රාම නිළධාරිතුමා දුරකථනය මඟින් සම්බන්ධ කරන ගත් අවස්ථාවේදී එතුමා තමන්ට බැණ වැදුණු අතර සියලු මන්ත්‍රීවරුන් පක්ෂ පාට භේදයකින් තොරව මේ සියලු දේ සිදු කරනුයේ අහිංසක ජනතාව වෙනුවෙන් බවද එබැවින් මේ පිළිබඳව එම ග්‍රාම නිළධාරි තුමා දැනුවත් කරන ලෙස ද ගරු සභාපතිතුමාට පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මේ දිනවල සියලුදෙනාම ගෙවතු වගාව සිදු කරන බැවින් නගර සභා කොම්පෝස්ට් පොහොර රු. 5.00 කට ලබා දීම අගය කරන අතර සිරි වීරසුන්දරාරාමයේ ගෙවතු වගාව සිදු කරන බැවින් ඒ සඳහා පොහොර කිලෝ 250 ක් නොමිලේ ලබා දෙන ලෙස පවසන ලදී. එමෙන්ම නගරයේ විෂබීජහරණය කිරීම ඉතාමත් සුදුසු බවත් සතොස වෙළෙඳසැළ හා බැංකු අසළ විෂබීජහරණය සිදු කරන ලෙසත් පවසන ලදී.

එමෙන්ම ව්‍යාපාරිකයන් ද මේ දින වල අසරණ වී අඩු ආදායම් තත්ත්වයට පත්ව ඇති බැවින් ඔවුන් වරිපනම්, කඩකුලී, ව්‍යාපාරික බදු හා බලපත්‍ර ගාස්තු ආදිය ගෙවා නොමැතිනම් ඔවුන්ට සාධාරණයක් ඉටු කරන ලෙසද ඇඳිරි නීතිය පවතින අවස්ථාවේදී බළන්ගොඩ නගරයේ ද ඇතැම් වෙළෙඳසැල් විවෘතව පවතින අතර නීතිය කඩ කරන්නන් වෙනුවෙන් දඩුවම් ලබා දිය යුතු බවද පවසන ලදී. ලෝකවාසි ජනතාවට මෙන්ම ලංකාවාසී ජනතාවටද කොවිඩ් 19 වසංගතය දුරුවේවා පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම වසංගත තත්ත්වය හමුවේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා මෙන්ම බළන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශය ඇතුලු සියලුම කාර්ය මණ්ඩලය පවතින අවධානම් තත්ත්වය නොසලකා සේවය කරන අතර ඒ පිළිබඳව ස්තුතිය පළ කරන බවත්, වෙළෙඳ සංගමය විසින් ගරු සභාපතිතුමා හරහා සෑම කොට්ඨාශයක් සඳහාම බඩු මලු ලබා දුන් අතර එම බඩු මලු ග්‍රාම නිළධාරිවරුන් හරහා ජනතාවට බෙදූ දුන් නමුත් එය නිසි පරිදි ලබා දී නොමැති බැවින් ග්‍රාම නිළධාරි සතු නාම ලේඛනය පරීක්ෂා කර බලන ලෙස පවසන ලදී. ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා ජනතා නියෝජිතයින් ලෙස ජනතාවට වගකිව යුතු අතර මන්ත්‍රීවරු සභාවේ සිටියදී මෙවැනි දේ ලබා දීමේදී මීට වඩා අවධානය යොමු කරන ලෙෂ පවසන ලදී.

එමෙන්ම ජනාධිපති කාර්ය සාධක බලකාය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛය පරිදි අදාළ පළාත් පාලන නියෝජිතයා ප්‍රමුඛ කමිටුව පත්කර ඇති බවත්, මහජනතාවට සහන ලබා දීමේදී එය සාධාරණයව සිදු විය යුතු අතර තමන් අසාධාරණයට යටත් නොවන බවද මේ සඳහා දේශපාලන නායකත්වය තිබිය යුතු අතර සභාපතිතුමා මේ පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතු බව පවසන ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් තමා ඇතුළු ප්‍රදේශයේ දේශපාලඥයින් හා අදාළ වසම භාරව සිටින රජයේ නිළධාරීන් විසින් දෙහිගස්තලාව වසමේ රු.5,000.00 දීමනාව ලැබිය යුතු පිරිසගේ නාම ලේඛනය සකස් කළ අතර මේ තුළට මෙයට අදාළ නොවන මන්ත්‍රීවරයෙකුද නොවන තෙවන පාර්ශවයේ පුද්ගලයෙකු පැමිණ අදාළ නාම ලේඛනයේ නම් දේශපාලනික පදනමින් කපා දමා ඇති අතර ඒ පිළිබඳව තම කණගාටුව පළ කරන ලදී. තමන් අසාධාරණයට හිස නොනමන අතර අද දින තමාට ලැබෙන දීමනාව මගින් නම් ඉවත් කර ඇති පිරිසට හැකි අයුරින් ආධාර සිදු කරන බවද දුප්පත් ජනතාවට සියළු දීමනා ලැබෙන නමුත් මධ්‍යස්ථ පන්තියට කිසිඳු දීමනාවක් නොලැබෙන බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් අප රට බෞද්ධ රටක් බැවින් අප රටට ආශිර්වාදයක් පවතින අතර මේ දිනවල පවතින වර්ෂාව නොමැති වීම ද මෙම රෝගය පාලනයට සුදුසු දේශගුණයක් වන බව පවසන ලදී. එමෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රවුෆ් හකීම් මහතා විසින් මුස්ලිම් ජාතික කොරෝනා රෝගීන් මිය ගිය විට පුළුස්සා දැමීම සම්බන්ධයෙන් සිදු කළ ප්‍රකාශය හෙළා දකින බව පවසන ලදී.

එමෙන්ම පුද්ගලික අංශයේ බඩු බෙදා දීම තුලින් බඩු මිල ඉහළ ගිය බවද, එහි වටිනාකමෙහි ප්‍රමාණයට බඩු මල්ලෙහි බඩු නොමැති බැවින් එම වැඩසටහන  අසාර්ථක බවද පවසන ලදී. නමුත් සභාව විසින් කොරෝනා ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ගත් තීරණ තුළින් 60%ක් සාර්ථක වී ඇති අතර කොරෝනා ව්‍යප්තිය පාලනය කිරීම සම්බන්ධයෙන් බළන්ගොඩ නගරය සාර්ථක බව බොහෝ පිරිසක් පවසන බව සඳහන් කරන ලදී. ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ රජය විසින් කොරෝනා ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ජනතාවට ලබා දෙන සහන පිළිබඳ ස්තුතිවන්ත වන අතර ජනතාවට බඩු භාණ්ඩ ලබා දීම වෙනුවට මුදල් ලබා දීම සුදුසු බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි පී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනි පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් වෙළෙඳ සංගමය හා බළන්ගොඩ නගර සභාව එක්ව බෙදා දුන් බඩු මලු අදාළ කොට්ඨාශ භාර ග්‍රාම නිළධාරීන් විසින් නිසි ක්‍රමවේදයකට බෙදා නොමැති අතර රාජ්‍ය නිළධාරීන් සිටින නිවෙස් සඳහාද මෙම බඩු මලු ලබා දී ඇති බව පවසන ලදී.එබැවින් මින් ඉදිරියට මෙසේ බඩු මලු බෙදා දෙන්නේනම් එම බඩු මලු බෙදා දෙන ක්‍රමවේදය සොයා බලන ලෙසද කම කොට්ටාශයේ බඩු මලු බෙදා දී ඇති ආකාරය පිළිබඳ තමන් කණගාටු වන බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු මන්ත්‍රීතුමිය රජය විසින් ලබා දෙනු ලබන රු.5,000.00 දීමනාව කිසිඳු පක්ෂ භේදයකින් තොරව සෑම පවුලක් සඳහාම ලබා දෙන බවද එම මුදල ලබා දීමේදී කිසිඳු අසාධාරණයක් නොවන බව ද පැවසූ අතර කොම්පෝස්ට් පොහොර ලබා දීමේදී නගර සභා සීමාව තුළ අවශ්‍යතාවය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මේ මොහොත වන විට ශ්‍රී ලංකාව තුළ මෙන්ම මුලු ලෝකය තුළම කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ජනතාව මහත් අසරණ තත්ත්වයකට පත්වී ඇති අතර බළන්ගොඩ නගරයට මෙම වසංගතය ගෙන ඒම වැළැක්වීම සඳහා ගරු සභාපතිතුමා විශාල වෙහෙස මහන්සියක් දරා කටයුතු සිදු කරන බැවින් ඒ පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාව තුලින් මෙන්ම මුලු මහත් ලෝකයෙන්ම මෙම වෛරසය ඉතා ඉක්මනින්ම තුරන් වී දුරුවේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**07. අවසානය**

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බඩු මලු බෙදා දීම පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් කෙතරම් දෝෂාරෝපණය කළද වෙළෙඳ සංගමය ප්‍රමුඛ ව්‍යාපාරිකයින් හා තරුණ ප්‍රජාව එක්ව මෙම බඩු මලු ලබා දීම සඳහා කටයුතු සංවිධානය කර තමන් දැනුවත් කළ බව පවසන ලදී.එමෙන්ම මෙම වැඩසටහන මඟින් බඩු මලු 150ක් පමණ සකස් කළ අතර එක කොට්ඨශයකට බඩු මලු 15 ක් වන සේ ලබා දුන් බවත්, එක් කොට්ඨාශයක් සඳහා ලබා දුන් බඩු මලු ප්‍රමාණය සීමිත බැවින් ඒවා ලබා දීමේදී දේශපාලඥයින් වශයෙන් මන්ත්‍රීවරුන් මහත් අසීරුතාවයකට පත්වන නිසා ඒ සඳහා මන්ත්‍රීවරුන් සම්බන්ධ කර නොගත් බව පවසන ලදී. කිසිඳු මන්ත්‍රීවරයෙකුට කිසිඳු පීඩනයක් ඇති නොවන සේ මෙම බඩු මලු බෙදා දීම සිදු කළ යුතු නිසා මෙම වැඩසටහන ග්‍රාම නිළධාරීන් හරහා සිදු කළ බවත්, මෙම ව්‍යාපෘතියේ තවත් මුදලක් ඉතිරිව ඇති අතර දෙවන අදියරක් සඳහා යාමට සූදානම් බවද කිසිදු චෝදනාවක් මන්ත්‍රීවරුන්ට නොවෙන පරිදි ග්‍රාම නිළධාරිවරුන් සඳහා එහි වගකීම පැවරෙන බවද පවසන ලදී.

එමෙන්ම ගරු උප සභාපතිතුමා පැවසූ දේ පිළිබඳ තමන්ට පැහැදිලි නොමැති අතර එවැනි සිද්ධියක් සම්බන්ධයෙන් තමන් දැනුවත් නොමැති බව පවසන ලදී. මෙම වසංගතය රටට පැමිණි වහාම මධ්‍යම රජය ක්‍රියාත්මක වීමටත් පෙර බළන්ගොඩ නගරය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය තීන්දු තීරණ හා පියවර ගත් බැවින් බළන්ගොඩ නගරය ආරක්ෂා කර ගැනීමට හැකි වූ බවත්, මෙම වැඩසටහන් කරගෙන යාමේදී සියලු දෙනා තමන් ගැන තබා ගත් විශ්වාසයට ස්තුතිය පළ කරන බවත් පවසන ලදී.

බළන්ගොඩ නගර සභාව අනෙකුත් සියලුම පළාත් පාලන ආයතන වලට පෙර අවශ්‍ය තීන්දු තීරණ ගෙන මහජන සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් හා බළන්ගොඩ නගර සභාවට කීර්තියක් අත්කර දීම සඳහා වසංගතයේ අවධානම නොසළකා හැර කටයුතු කළ අතර ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට ද ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටද හෘදයාංගම ස්තුතිය පළකරන අතර ඉදිරියටද අවශ්‍ය වැඩසටහන් නිසි පරිදි කරගෙන යාම සඳහා තමාට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.